දිවි තොරකර ගැනීම් පිළිබඳ පුවත් වැඩිවැඩියෙන් වාතර්ා වන විට, මාධ්‍ය වඩාත් ප්‍රවේසම් සහගතව සහ ආචාර ධාමර්ිකව එම පුවත් වාතර්ා කිරීම අත්‍යවශ්‍ය වේ. මන්ද යත්, පයෙර්ෂණ මගින් මේ වන විට පෙන්වා දී ඇති ආකාරයට, දිවි තොර කර ගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යා හැකි බැවිනි.
එම පසුතලය යටතේ, දිවි තොර කර ගැනීමක් ද නැද්ද යන්න සැකසහිත මරණයක් සම්බන්ධයෙන් වාතර්ා කිරීමේදී පවා, මාධ්‍ය නිසි ප්‍රවේසමක් අනුගමනය කළ යුතු නොවේදැයි පාඨක අප ඇසිය යුතු වේ.
රක්වාන ලැගුම්හලකට පෙම්වතා සමඟ පැමිණ, එම ලැගුම්හලේදී මිය ගොස් සිටි තරුණියගේ සිදුවීම මෙයට එක් නිදසුනකි. එහිදී මෙම මරණය දිවි තොර කර ගැනීමක් ද නැතිද යන්න නිශ්චිතව තීරණය වී නොමැති වුවත්, ඇතැම් මාධ්‍ය එය දිවි නසාගැනීමක් වීමට හැකිය යන අතට නැඹුරුව වාතර්ා කර තිබිණි.
එවැනි වාතර්ා කිරීමකදී වුවත්, දිවි තොරකර ගෙන ඇති බවට සැක කරන ක්‍රමය සිරස්තල තුළම නොදැක්වීම, හදිසි උපකාරක අංක සඳහන් කිරීම ඇතුළු දිවි තොර කරගැනීම් වාතර්ා කිරීම සම්බන්ධ මාධ්‍ය මාගෙර්ෝපදේශයන් පිළිපැදිය යුතු නොවේ දැයි අපි අසමු.
මෙවැනි පුවත් වාතර්ාවන් සමඟ හදිසි උපකාරක අංක පළ කිරීම මගින්, දිවි තොර කර ගැනීමට නැඹුරුවක් ඇතිව සිටින අයෙකුට අවශ්‍ය උපදේශනය ලබා දීමටත්, ඒ ඔස්සේ එම තැනැත්තාගේ ජීවිතය බේරා ගැනීමටත් ඉඩක් ලැබෙනු ඇත.
උපකාරක අංකයක් පළ කරමු. ජීවිතයක් රැක ගනිමු.
හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාගර්යෙන් සම්බන්ධ කරගත හැක)
මූලාශ්‍ර:
https://accountablejournalism.org/.../australia-standards...
https://media.samaritans.org/.../Media_Guidelines_FINAL.pdf
https://apps.who.int/.../258814/WHO-MSD-MER-17.5-eng.pdf
https://www.ncbi.nlm.nih.gov/books/NBK207262
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධමර් කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!